ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2018 මැයි 07 යොමු අංකය: 1718-039A

දයාබර දෙමව්පියන් වෙත,

# වෙසක් ළමා සිල් පිංකම - 2018

අප දහම් පාසලේ දරු දැරියන් සඳහා විශේෂිත වූ සිල් පිංකමක් පූජ්‍යපාද අලුත්ගම පඤ්ඤාසාර ස්වාමීන් වහන්සේගේ මෙහෙයවීමෙන් මැයි මස 11 වැනිදා, සිකුරාදා දහම් පාසල් ශාලාවේදී පැවැත්වීමට සූදානම් කර ඇති බව ඉතා කරුණාවෙන් දැනුම් දෙමු.

දහම් පාසල් ශාලාව භාවිතා කිරීම පිලිබඳ දැනට තිබෙන තත්වය ගැන සලකා බලා මෙම සීල සමාදානය දරුවන් සඳහා පමණක් පැවැත්වෙන අතර, දෙමාපියන් සිල් සමාදන් වීමෙන් වැලකී සිටින ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු. දැනට පවතින වාතාවරණය නිසා පින්කමේ සංවිධාන කටයුතු ආදිය ගුරු මණ්ඩලයේ සාමාජික මහතුන් සහ මහත්මීන් විසින් සහ දෙමාපිය කමිටුව විසින් සිදුකෙරෙන අතර අනෙකුත් දෙමාපියන්ගේ සහභාගිත්වය අවශ්‍ය නොවන බවද කරුණාවෙන් දැනුම් දෙමු.

පින්කමට අවශ්‍ය පූජා භාණ්ඩ සහ දානය (ආහාර) ආදිය දහම් පාසල් ශාලාවට ගෙනැවිත් භාරදෙන්න.

දරුවන්ගේ පැමිණීමේදී සහ පිටත්වීමේදී පැවතිය හැකි තදබදය වැළැක්වීම සඳහා පහත සඳහන් වේලාවන් අනුව පමණක් දරුවන් ශාලාවට රැගෙන ඒම සහ රැගෙන යාම සිදු කල යුතු බව අවධාරණය කරමු. දරුවන් දෙදෙනෙකු (වයස් සීමා දෙකක) රැගෙන එන දෙමාපියන් එක් දරුවෙකුට අදාළ වෙලාවට රැගෙන එන්න.

1. **උදෑසන 7.30 සිට 8.00 දක්වා: දරුවන්ගේ පැමිණීම**
   - 4,5,6,7,8 වසර දරුවන්: උදෑසන 7.30 සිට 7.40 දක්වා
   - 2 සහ 3 වසර දරුවන්: උදෑසන 7.40 සිට 7.50 දක්වා
   - 1 වසර දරුවන්: උදෑසන 7.50 සිට 8.00 දක්වා

2. **දහවල් 1.30 සිට 2.10 දක්වා: දරුවන්ගේ පිටත් වීම**
   - 1 වසර දරුවන්: දහවල් 1.30 සිට 1.40 දක්වා
   - 2 වසර දරුවන්: දහවල් 1.40 සිට 1.50 දක්වා
   - 3 සහ 4 වසර දරුවන්: දහවල් 1.50 සිට 2.00 දක්වා
   - 5,6,7,8 වසර දරුවන්: දහවල් 2.00 සිට 2.10 දක්වා

3. **පහත සඳහන් වේලාවන් අනුව පිංකම පැවැත්වෙනු ඇත.**

| වේලාව - සිට | දක්වා | වැඩ සටහන |
|---|---|---|
| පෙ ව 8.00 | පෙ ව 8.30 | උදෑසන බුද්ධ පූජාව |
| පෙ ව 8.30 | පෙ ව 8.50 | හීල් දානය |
| පෙ ව 8.50 | පෙ ව 11.00 | ධර්ම දේශනය, භාවනා කිරීම ඇතුළු දරුවන් සඳහා වැඩ සටහන් |
| පෙ ව 11.00 | පෙ ව 11.30 | දහවල් බුද්ධ වන්දනාව |
| පෙ ව 11.30 | පෙ ව 12.00 | දහවල් දානය |
| පෙ ව 12.00 | ප ව 12.30 | Buddha Charithaya Documentry movie |
| ප ව 12.30 | ප ව 1.30 | ධර්ම සාකච්චාව සෙත් පිරිත් දේශනය සහ සිල් පවාරණය |

**වැදගත් උපදෙස්:**

- **දෙමාපියන් දානය රැගෙන ඒම;**
  - හීල් දානය සැපයීම රාහුල විද්‍යාලය ආදී සිසුන් විසින් සිදුකෙරෙනු ඇත.
  - සිකුරාදා දහවල් දානය සපයන දෙමාපියන් කරුණාකර උදෑසන 10.00ට පෙර ගෙනවිත් භාර දෙන්න
  - වියලි ආහාර, පලතුරු බීම, වතුර, පිඟන්, කෝප්ප ආදිය බ්‍රහස්පතින්දා සවස ගෙනවිත් භාර දෙන්න.

- දරුවන් දහම් පාසල ශාලාවට කැඳවාගෙන විත් අපට භාරදී කරුණාකර කොන්සල් ජෙනරාල් කාර්යාල පරිශ්‍රයෙන් පිටත් වෙන්න. මෙම ස්ථානයේ හෝ අවට හෝ පාරවල් වල රැඳී සිටීමෙන් වලකින්න.
- ගුරු මණ්ඩලය සහ දෙමාපිය කමිටු සාමාජිකන් දරුවන් හට අවශ්‍ය සෑම පහසුකමක්ම සපයනු ඇත.
- සිල් සමාදන් වීමේදී අවශ්‍ය උතුරු සළුව (සිල් රෙද්ද) සහ පත්කඩය (කුඩා සුදු රෙද්ද) කරුණාකර දරුවන් හට සපයන්න.
- මොබයිල් දුරකථන, Tablet වැනි උපකරණ දරුවන් හට ලබාදීමෙන් වලකින්න.
- දරුවන්ගේ ලාංජනය (Badge) සහ හැඳුනුම් පත (ID) පැළඳීම අවශ්‍ය නැත.

මෙදින සාමාන්‍ය දහම් පාසල් දිනයකදී අදාළ (වාහන නතර කිරීම ආදී) සියලුම කොන්දේසි තරයේ අනුගමනය කල යුතු බව අවධාරණය කරමු. ආහාර (දානය) රැගෙන එන දෙමාපියන්ද වාහන නැවැත්වීම සඳහා අදාළ කොන්දේසි අනුව සුදුසු ස්ථානයක වාහනය නවත්වා දානය රැගෙන ආ යුතු ඉතා බව ඉතා කරුණාවෙන් දැනුම් දෙමු

බ්‍රහස්පතින්දා සවස 7.00 ට දහම් පාසල ශාලාව සහ අවශ්‍ය බඩු බාහිරාදිය සකසා ගැනීම සඳහා දෙමාපියන්ගේ සහයෝගය අවශ්‍ය බවද කාරුණිකව දැනුම් දෙමු.

**ස්තුතියි,**

**සංවිධායක මණ්ඩලය**